# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2436/11 - 2025 මැයි මස 16 වැනි සිකුරාදා - 2025.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ වන ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

ඊ. ඩබ්ලිව්. එම්. ලලිත් ඒකනායක,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2025 මැයි මස 07 වැනි දින,
කොළඹ 07,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
09 වන ගොඩනැගිල්ල,
ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති**

01. මෙම රීති, "**2025 ජාතික පොලිස් කොමිෂන් සභා (අභියාචනා කාර්ය පටිපාටික) රීති**" යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. සහ 155එ. ව්‍යවස්ථා යටතේ පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරන ලද කමිටුවක් විසින් හෝ පොලිස්පතිවරයා විසින් හෝ පොලිස් නිලධරයෙකු විසින් හෝ කරනු ලැබූ උසස් කිරීමක්, ස්ථාන මාරු කිරීමක්, විනය කාරණයක් සම්බන්ධයෙන් කරනු ලැබූ යම් නියෝගයක් හෝ සේවයෙන් පහ කිරීමක් සම්බන්ධයෙන් කරනු ලැබූ යම් නියෝගයකින් අතෘප්තියට පත් වන යම් පොලිස් නිලධරයෙකු හට ඔහු/ඇය සම්බන්ධයෙන් වන එවැනි නියෝගයකට එරෙහිව ලිඛිත අභියාචනයක් මෙහි පහත නියමකර ඇති රීති යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය.


1A - PG 7096 — 104 (2025/05)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**03. උසස් කිරීම් සම්බන්ධයෙන් වන තීරණ වලට එරෙහි අභියාචනා ඉදිරිපත් කිරීම**

03.1 බලය අභිනියෝජිත බලධරයකු විසින් කරන ලද උසස් කිරීමේ නියමයකින් අතෘප්තියට පත් යම් නිලධරයකු විසින් එම නියමයට එරෙහිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකිවන්නේ ය.

03.2 උසස් කිරීමක් පිළිබඳව නිලධරයකු විසින් කරනු ලබන අභියාචනයක් <u>අංක 1 වන පරිශිෂ්ටය</u> ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු වන්නේය. තම අභියාචනය තහවුරු කිරීමට තමා විසින්ම සහතික කළ අදාළ ලියවිලිවල පිටපත් ඉදිරිපත් කිරීමට ද ඔහු ක්‍රියා කළ යුතු වන්නේ ය.

03.3 පොලිස් නිලධරයකු විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළයුතු වන්නේ බලය අභිනියෝජිත බලධරයා මගින් වන අතර, එම අභියාචනයේ පිටපතක් යථායෝග්‍ය පරිදි පොලිස්පති හා ආයතන ප්‍රධානියා වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව කොමිෂන් සභාව වෙත යොමු කිරීම බලය අභිනියෝජිත බලධරයාගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් ඍජුවම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

03.4 බලය අභිනියෝජිත බලධරයකු විසින් කරන ලද උසස් කිරීමේ නියමයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම නියමය කරන ලද දින සිට දින 30ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

03.5 තමන් රජයේ සේවයේ නියැලී සිටි කාලය තුළ දී ලැබිය යුතුව තිබූ උසස්වීමක් සම්බන්ධයෙන් වන නියමයක් තමන් රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ පසු අදාළ බලය අභිනියෝජිත බලධරයා විසින් කර ඇති විටක, ඊට විරුද්ධ අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන විශ්‍රාමිකයෙකු, එම නියමය ලද දින සිට දින 30ක් ඇතුළත එම අභියාචනය ඍජුවම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. එසේතුදු වුවත්, එම අභියාචනයෙහි පිටපතක් ඔහුගේ පූර්ව දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පූර්ව ආයතන ප්‍රධානියා හෝ වෙත ද යැවිය යුතු වන්නේ ය.

03.6 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනය අදාළ සියලු ලිපි ගොනු ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ ඉදිරිපත් කිරීමට පොලිස්පතිවරයා වගබලා ගත යුතු වන්නේ ය.

03.7 ඉහත නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම විශ්‍රාමික පොලිස් නිලධරයකු ඇතුලු සෑම පොලිස් නිලධරයකුගේම වගකීම වන අතර ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේ ය.

03.8 කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත් වන නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේ ය.

**04. වාර්ෂික ස්ථාන මාරු හැර, අනිකුත් ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තීරණවලට එරෙහි අභියාචනා ඉදිරිපත් කිරීම.**

04.1 බලය අභිනියෝජිත බලධරයකු විසින් කරන ලද වාර්ෂික ස්ථාන මාරු හැර අනිකුත් ස්ථානමාරු කිරීමේ නියමයකින් අතෘප්තියට පත් යම් නිලධරයකු විසින් එම නියමයට එරෙහිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකිවන්නේ ය.

04.2 වාර්ෂික ස්ථාන මාරු කිරීමක් හැර අනෙකුත් ස්ථාන මාරු කිරීමක් පිළිබඳව නිලධරයකු විසින් කරනු ලබන අභියාචනයක් <u>**අංක 2 වන පරිශිෂ්ටය**</u> ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු වන්නේය. තම අභියාචනය තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් ඉදිරිපත් කිරීමට ද ඔහු ක්‍රියා කළ යුතු වන්නේ ය.

04.3 පොලිස් නිලධරයකු විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ බලය අභිනියෝජිත බලධරයා මගින් වන අතර, එම අභියාචනයේ පිටපතක් යථායෝග්‍ය පරිදි පොලිස්පති හා ආයතන ප්‍රධානියා වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව කොමිෂන් සභාව වෙත යොමු කිරීම බලය අභිනියෝජිත බලධරයාගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් ඍජුවම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

04.4 බලය අභිනියෝජිත බලධරයකු විසින් කරන ලද වාර්ෂික ස්ථාන මාරු කිරීමක් හැර ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියමය අදාළ නිලධරයා වෙත ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

04.5 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනය අදාළ සියලු ලිපි ගොනු ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ ඉදිරිපත් කිරීමට පොලිස්පතිවරයා වගබලා ගත යුතු වන්නේ ය.

04.6 ඉහත නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම නිලධරයකුගේම වගකීම වන අතර ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේ ය.

04.7 කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත් වන නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේ ය.

**05. තනතුර අතහැර යාමේ නියෝගවලට එරෙහිව සිදු කරනු ලබන අභියාචනා ඉදිරිපත් කිරීම.**

05.1 තනතුර අතහැරයාමේ නිවේදනය නිකුත් කරන ලද දින සිට මාස තුනක (03) කාලයක් ඇතුළත, එසේ තනතුර අතහැර ගියා සේ සැලකෙන තැනැත්තෙකු, විසින් තමන් රාජකාරියට වාර්තා නොකිරීම පිළිබඳව හේතු දැක්වීමක් ලිඛිතව ඔහුගේ විනය බලධරයා වෙත දන්වමින්, නැවත සේවයෙහි පිහිටුු වන ලෙස අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, විනය රීතීන්ට අනුකූලව, විනය බලධරයා විසින් එම අභියාචනය සලකා බැලිය යුතු වන්නේ ය.

05.2 අදාළ අභියාචනයේ සඳහන් කරුණු අනුව නිලධරයා සේවයට වාර්තා නොකර ඇත්තේ පිළිගත හැකි හේතූන් මත බව විනය බලධරයාට පැහැදිලි වන්නේ නම්, පහත සඳහන් කවර හෝ ආකාරයකින් නිලධරයා නැවත සේවයෙහි පිහිටුු වීමට හෝ නැවත සේවයට පත් කිරීමට නියෝග කිරීමට ඔහුට පුළුවන.

i. සුදුසු විනයානුකූල දඬුවම් සහිතව,

ii. සුදුසු කොන්දේසිවලට යටත් කොට,

iii. සුදුසු විනය දඬුවම් සහිතව සහ සුදුසු කොන්දේසිවලට යටත් කොට,

iv. දඬුවම් සහ කොන්දේසි රහිතව,

05.3 ඉහත 05.2 පරිදි නැවත සේවයේ පිහිටුු වන ලද හෝ නැවත සේවයට පත් කරන ලද නිලධරයකු සේවයේ නොසිටි සම්පූර්ණ කාලය වැටුප් රහිත කාලයක් සේ සැලකිය යුතු අතර එවැනි කාල පරිච්ඡේදයක් කිසිදු උසස් වීමකට හෝ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගණනය කිරීමේ දී හෝ වැටුප් වර්ධක ලබා දීම සඳහා හෝ වෙනත් කිසිදු ප්‍රතිලාභ ලබා දීමක් හෝ හිමිකමක් සහිත කාල පරිච්ඡේදයක් ලෙස නොසැලකිය යුතු වන්නේ ය.

05.4 අභියාචනයේ සඳහන් කරුණු පිළිගත නොහැකි බව විනය බලධරයා විසින් සලකනු ලබන්නේ නම් සේවයේ පිහිටුුවීම සඳහා වන අභියාචනය ප්‍රතික්ෂේප කළ හැක්කේ ය.

05.5 විනය බලධරයා කොමිෂන් සභාව නොවන කල්හි 05.2 හෝ 05.4 වන වගන්ති යටතේ ලබා දෙන ලද තීරණයකට හෝ නියෝගයකට එරෙහිව එකී තීරණය හෝ නියෝගය නිකුත් කළ දින සිට මාස හය (06) ක් ඇතුළත කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට නිලධරයකුට හැකියාව ඇත්තේ ය.

05.6 එවැනි අභියාචනයක් සලකා බැලීමෙන් අනතුරුව කොමිෂන් සභාවට විනය බලධරයාගේ තීරණය හෝ නියෝගය වෙනස් කිරීමට හෝ මද වශයෙන් වෙනස් කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට හෝ ස්ථිර කිරීමට හෝ කොමිෂන් සභාවට සුදුසු යැයි හැඟෙන වෙනත් විධානයක් හෝ කිරීමට හැකි වන්නේ ය.

05.7 කොමිෂන් සභාවේ තීරණයකින් හෝ නියෝගයකින් අතෘප්තියට පත් වන පොලිස් නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි වන්නේ ය.

**06. විනය නියෝගවලට එරෙහිව සිදු කරනු ලබන අභියාචනා ඉදිරිපත් කිරීම.**

06.1 විනය බලධරයකු විසින් පනවනු ලැබූ යම් විනය නියෝගයකට පාත්‍ර වූ නිලධරයකුට එම විනය නියෝගයට එරෙහිව අදාළ වන පරිදි කොමිෂන් සභාව වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

06.2 විනය නියෝගයක් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ නියෝගයෙන් අතෘප්තියට පත් නිලධරයා විසිනි. ඔහු වෙනුවෙන් වෙනත් පුද්ගලයකු විසින් ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් අදාළ අභියාචනා බලධරයා විසින් බාරගනු ලබන්නේවත් ලැබුණු බව දන්වනු ලබන්නේවත් නොමැත.

06.3 කොමිෂන් සභාව හෝ බලතල පවරනු ලැබ ඇති බලධරයකු විසින් පනවන ලද විනය නියෝගයකින් අතෘප්තියට පත් වූ නිලධරයකුට එම විනය නියෝගයට විරුද්ධව කොමිෂන් සභාව වෙත එක් කරුණක් සම්බන්ධයෙන් එක් අභියාචනයක් පමණක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය.

06.4 6.3 උප වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන අභියාචනය විනය නියෝගය ලැබී මාස තුනක් ඇතුළත් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. එසේවුවද පිළිගත හැකි හේතූන් ඇත්නම් කොමිෂන් සභාවේ අභිමතය පරිදි මාස තුනකට (03) පසු සහ මාස හයකට (06) කට ප්‍රථම ලැබෙන සේ ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද පිළිගත හැකි වන්නේය.

06.5 පොලිස් සේවයේ යෙදී සිටින නිලධරයකු කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ තම ආයතන ප්‍රධානියා සහ විනය බලධරයා මගිනි. විනය නියෝගය නිකුත් කර මාස තුනක් ගත වීමට ප්‍රථම තම ආයතන ප්‍රධානියා වෙත අභියාචනය නිසි පරිදි භාරදීම නියමිත කාලයේ දී අභියාචනය ඉදිරිපත් කිරීමක් සේ සළකනු ලැබේ. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා තමන් වෙත භාර දෙන අභියාචනා පිළිබඳව අප්‍රමාදව ක්‍රියාකොට තම නිරීක්ෂණ හා නිර්දේශ සහිතව ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව අදාළ සියලුම ලිපිගොනු හා ලිපි ලේඛන ද සහිතව නොපමාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානියාගේ මෙන්ම විනය බලධරයාගේ ද වගකීම වන්නේය. සේවයෙන් පහ කර ඇති නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි තම අභියාචනය ඔහු විසින් කෙළින්ම කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

**07. පොදු කරුණු**

07.1 එක් කරුණක් සම්බන්ධයෙන් සේවයේ යෙදී සිටින නිලධරයකු විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ බලය අභිනියෝජිත බලධරයා මගිනි. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව කොමිෂන් සභාව වෙත යොමු කිරීම බලය අභිනියෝජිත බලධරයාගේ වගකීම වන්නේ ය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් ඍජුවම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.

07.2 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනය අදාළ ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය පිළිබඳව සඳහන් කරමින්, ඊට අදාළ තම නිරීක්ෂණ ද නිර්දේශය ද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ ඉදිරිපත් කිරීමට අදාළ බලධරයා වගබලා ගත යුතු වන්නේ ය.

07.3 එක් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත එක් නිලධරයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අභියාචනයක් පමණි. එකී අභියාචනය ඉදිරිපත් කිරීමේදී, තම අභියාචනයේ සඳහන් කරුණු මෙන්ම අභියාචනයේ සඳහන් කරුණු තහවුරු කරමින් ඉදිරිපත් කරනු ලබන ලේඛන ද, සත්‍යවූත්, නිවැරදිවූත් ලේඛන බවට අභියාචනය ඉදිරිපත් කරන පොලිස් නිලධරයා විසින් <u>දිවුරුම් ප්‍රකාශයක් මගින්</u> තහවුරු කළ යුතු ය.

07.3.1 තවද, එවැනි දිවුරුම් ප්‍රකාශයක පහත සඳහන් දෑ ඇතුළත් කළ යුතුය :-

(අ) මෙම ප්‍රශ්නගත කරුණට අදාළව/සම්බන්ධයෙන් මීට පෙර වෙනත් අභියාචනයක් ඉදිරිපත් කර තිබුනේද/ තිබේද යන්න ;

(ආ) මෙම ප්‍රශ්නගත කරුණ හා සම්බන්ධයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයෙහි හෝ වෙනත් යම් අධිකරණයක නීතිමය කටයුත්තක් පවතින්නේද *නැතහොත්* ඒ සම්බන්ධයෙන් එවැනි අධිකරණයක නීතිමය කටයුත්තක් අවසන් වී තිබේ ද යන්න ;

(ඇ) එසේ නම් අදාළ යොමු/නඩු අංක, තීන්දු/තීරණ සහ වෙනත් අදාළ විස්තර -

07.4 අභියාචනය ඉදිරිපත් කරනු ලබන අභියාචක සම්බන්ධයෙන් පහත සඳහන් මූලික කරුණු ද එම අභියාචනයේ සඳහන් කළ යුතුය.

1. හැඳුනුම්පත් අංකය
2. නිලය/නිල අංකය
3. වර්තමාන ලිපිනය
4. දුරකථන අංකය
5. වර්තමාන හෝ අවසන් වරට සේවය කළ ස්ථානය
6. විද්‍යුත් ලිපිනය (ඇත්නම්)

07.5 සෑම අභියාචනයක්ම කොමිෂන් සභාවේ ලේකම් අමතා එවිය යුතු වන අතර එසේ එවීමේ දී අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්තේ නම් මිස, ලියාපදිංචි තැපෑලෙන් *නැතහොත්* ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යාලයට අතින් ගෙනැවිත් භාර දිය යුතු අතර අභියාචනය ලැබුණු බවට **කුවිතාන්සියක්** කොමිෂන් සභාව විසින් නිකුත් කළ යුතු ය.

**08.** මෙම රීතීන් හි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම විශ්‍රාමිකයකු ඇතුලු සෑම නිලධරයකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

**09.** සේවයෙන් පහ කරන ලද නිලධරයෙකු හැර ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන කොමිෂන් සභාවේ තීරණය පොලිස්පතිවරයා මගින් නිලධරයා වෙත දන්වනු ලබන අතර එහි පිටපතක් අභියාචක නිලධරයා වෙත ද යවනු ලබන්නේ ය.

**10.** අභියාචනයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව තීරණයක්/ තීන්දු ප්‍රකාශයක් ලබාදී ඇති විට, ඉහත සඳහන් පරිදි කොමිෂන් සභාව දැනටමත් තීරණයක් ලබා දී ඇති අදාළ විෂය කරුණ සම්බන්ධයෙන් තවදුරටත් අභියාචනා සහ / හෝ ඉල්ලුම්පත්‍ර සහ/හෝ ඉල්ලීම් කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේ ය.

**11.** කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත් වන පොලිස් නිලධරයෙකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය.

**12.** මෙම කාර්ය පටිපාටික රීතීන්හි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

**13.** "කොමිෂන් සභාව" යන්නෙන් මෙහිදී අදහස් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති "ජාතික පොලිස් කොමිෂන් සභාව" වේ.

**14.** ඉහත අභියාචන කාර්ය පටිපාටික රීති, අංක 2310/29 හා 2022.12.14 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි සහ ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට අගති රහිතව නිකුත් කර ඇති අතර, එම විධිවිධානයන් තවදුරටත් අනුගමනය කරමින් කටයුතු කරන බව දන්වා සිටිමි.

15. මෙම අභියාචනා කාර්ය පටිපාටි රීති 2025 ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

**16.** 2023 අගෝස්තු මස 16 වැනි බදාදා, දින අංක 2345/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කළ **"2023 ජාතික පොලිස් කොමිෂන් සභා (අභියාචන කාර්ය පටිපාටික) රීති"** මෙයින් අවලංගු වන්නේ ය.

**පරිශිෂ්ටය 01**

(ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදනු ලබන අභියාචනා කාර්ය පටිපාටික රීති 03.2 වගන්තිය)

මුලකුරු සමග නම : ..............................................
ලිපිනය : ..................................................................
..................................................................
දිනය : ......................................................................

ආයතන ප්‍රධානියා මගින්
පොලිස්පති මගින්
ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්

..................................................................................................................................................................................................

**උසස් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනය**

1. අභියාචක පිළිබඳ විස්තර

1.1 සම්පූර්ණ නම : ..............................................................................................................................................

1.2 පෞද්ගලික දුරකථන අංකය : ..........................................................................................................

1.3 තනතුර : ..............................................................................................................................................

1.4 වර්තමාන සේවා ස්ථානය : ..............................................................................................................

1.5 ආයතනය : ..............................................................................................................................................

2. අභියාචනයට පදනම්ව වූ තීරණය / නියෝගය පිළිබඳ විස්තර

2.1 උසස්වීම සම්බන්ධයෙන් තීරණය/ නියෝගය ලබා දී ඇත්තේ කා විසින් ද යන්න (තීරණය ලබා දී ඇති බලධරයාගේ තනතුර සඳහන් කරන්න).

..............................................................................................................................................................

2.2 උසස්වීමට අදාළව ඉහත සඳහන් බලධරයා විසින් ලබා දී ඇති තීරණය/ නියෝගය කුමක් ද යන වග සැකෙවින් සඳහන් කරන්න.

..............................................................................................................................................................

2.3 උසස්වීම් සම්බන්ධව තීරණය/ නියෝගය අභියාචක වෙත ලැබුණු දිනය

..............................................................................................................................................................

2.4 උසස්වීම් සම්බන්ධයෙන් ලබා දී ඇති තීරණය/ නියෝගය දැක්වෙන ලිපිවල සහතික කළ පිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (1) ..............................................................................................

ඇමුණුම (2) ..............................................................................................

3. අභියාචනය ඉදිරිපත් කිරීම මගින් අභියාචක විසින් ඉල්ලා සිටිනු ලබන සහනය/ සහන

..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................

4. ඉහත (03) යටතේ සඳහන් කර ඇති සහන ඉල්ලුම් කිරීම සඳහා අභියාචක විසින් ඉදිරිපත් කරනු ලබන හේතු/කරුණු

4.1 ..............................................................................................................................................................

4.2 ..............................................................................................................................................................

4.3 ..............................................................................................................................................

4.4 ..............................................................................................................................................

4.5 ඉහත සඳහන් කරන ලද හේතු/කරුණු සනාථ කිරීම සඳහා අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (1) ..............................................................................................................................

ඇමුණුම (2) ..............................................................................................................................

ඇමුණුම (3) ..............................................................................................................................

5. අභියාචකගේ ප්‍රකාශය

ඉහත දක්වා ඇති සියලු තොරතුරු මාගේ දැනුමට අනුව සත්‍ය හා නිවැරදි තොරතුරු බවද, චේතනාන්විතවම අසත්‍ය හා වැරදි තොරතුරු සැපයීම, එනයින්ම අභියාචනය ප්‍රතික්ෂේප වීමට ද, විනය ක්‍රියාමාර්ගවලට යටත් වීමට ද හේතු වන බව මම හොඳාකාරවම දන්නා බව ද ප්‍රකාශ කර සිටිමි.

අත්සන : ..............................................................

නම : ..............................................................

තනතුර : ..............................................................

6. ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ/නිර්දේශ

..............................................................................................................................................

ඉහත අභියාචනය පිළිබඳ මාගේ නිරීක්ෂණ පහත පරිදි වේ.

1. ..............................................................................................................................................
2. ..............................................................................................................................................
3. ..............................................................................................................................................
4. ..............................................................................................................................................

ඒ අනුව අභියාචක විසින් ඉල්ලා සිටිනු ලබන සහන ලබාදීම සුදුසු/නුසුදුසු බව නිර්දේශ කරමි.

අත්සන : ..............................................................

නම : ..............................................................

තනතුර : ..............................................................

7. පොලිස්පතිගේ නිරීක්ෂණ/නිර්දේශ

..............................................................................................................................................

ඉහත කරුණු පිළිබඳ මාගේ නිරීක්ෂණ පහත පරිදි වේ.

1. ..............................................................................................................................................
2. ..............................................................................................................................................
3. ..............................................................................................................................................
4. ..............................................................................................................................................

ඒ අනුව අභියාචක විසින් ඉල්ලා සිටිනු ලබන සහන ලබාදීම සුදුසු/නුසුදුසු බව නිර්දේශ කරමි.

අත්සන : ..............................................................

නම : ..............................................................

තනතුර : ..............................................................

පිටපත

01. ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව - (අවශ්‍ය කටයුතු සඳහා මෙම ප්‍රගමන පිටපත ඔබ වෙත කාරුණිකව යොමු කරමි).

**පරිශිෂ්ටය 02**

(ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදනු ලබන අභියාචනා කාර්ය පටිපාටික රීති 04.2 වගන්තිය)

මුලකුරු සමග නම : ..............................................
ලිපිනය : ..................................................................
..................................................................
දිනය : ......................................................................

ආයතන ප්‍රධානියා මගින්
පොලිස්පති මගින්
ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්

**වාර්ෂික නොවන ස්ථාන මාරු නියෝගය සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනය**

1. අභියාචක පිළිබඳ විස්තර

1.1 සම්පූර්ණ නම : ..........................................................................................

1.2 පෞද්ගලික දුරකථන අංකය : ..........................................................................................

1.3 තනතුර : ..........................................................................................

1.4 වර්තමාන සේවා ස්ථානය : ..........................................................................................

1.5 කොට්ඨාසය : ..........................................................................................

2. අභියාචනයට පදනම්ව ඇති තීරණය / නියෝගය පිළිබඳ විස්තර

2.1 ස්ථාන මාරු තීරණය/නියෝගය ලබා දී ඇත්තේ කවුරුන් විසින් ද යන්න
(තීරණය ලබා දී ඇති බලධරයාගේ තනතුර සඳහන් කරන්න)

..........................................................................................

2.2 ඉහත බලධරයා විසින් ලබා දී ඇති ස්ථාන මාරු තීරණය/නියෝගය කුමක්ද යන වග සැකෙවින් සඳහන් කරන්න.

..........................................................................................

2.3 ස්ථාන මාරු තීරණය/නියෝගය නිලධරයාට ලැබුණු දිනය

..........................................................................................

2.4 ලබා දී ඇති ස්ථාන මාරුව සේවා අවශ්‍යතාව මත කරන ලද ස්ථාන මාරුවක් ද, විනය හේතු මත කරන ලද ස්ථාන මාරුවක්ද යන්න පැහැදිලි කරන්න (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න).

සේවා අවශ්‍යතාව මත සිදු කරන ලද ස්ථාන මාරුවකි ☐
විනය හේතු මත සිදුකරන ලද ස්ථාන මාරුවකි ☐

2.5 විනය හේතු මත සිදු කර ඇති ස්ථාන මාරුවක් නම් එය පහත සඳහන් කර ඇති කවර අවස්ථාවක සිදු කර ඇත්ද යන්න පැහැදිලිව සඳහන් කරන්න (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න).

2.5.1. මූලික විමර්ශනයක් ආරම්භ කිරීමට පෙරාතුව අනාවරණය වී ඇති කරුණු මත ☐

2.5.2. මූලික විමර්ශනයක් පවත්වාගෙන යන අතරතුර අනාවරණය වී ඇති කරුණු මත ☐

2.5.3 මූලික විමර්ශනයක් පැවැත්වීමෙන් පසුව අනාවරණය වී ඇති කරුණු මත ☐

2.5.4. විධිමත් විනය පරීක්ෂණයකට පසුව නිකුත් කරන විනය නියෝගයේ දඬුවමක් වශයෙන් ස්ථාන මාරුකිරීමක් නියෝග කර ඇති විට ☐

2.6. ඉහත ස්ථාන මාරු තීරණය/නියෝගය දැක්වෙන ලිපිවල සහතික කළ පිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (1) ...................................................................................................................................................

ඇමුණුම (2) ...................................................................................................................................................

***සැ.යු.*** ඉහත 2.5.4 හි සඳහන් කර ඇති පරිදි විනය නියෝගයක දඬුවමක් වශයෙන් ස්ථාන මාරු කිරීමක් පමණක් ඇතුළත් වන්නේ නම් මෙම ආකෘතිය මගින් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. විනය නියෝගයෙහි ස්ථාන මාරුවීමට අමතරව වෙනත් දඬුවමක් ද ඇතුළත් වන්නේ නම්, එකී සමස්ත විනය නියෝගයට එරෙහිව ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 26:5 වන සහ 26:6 වන වගන්තිවල විධිවිධාන පරිදි වෙනම අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය.

3. අභියාචනය ඉදිරිපත් කිරීම මගින් අභියාචක විසින් ඉල්ලා සිටිනු ලබන සහනය/ සහන

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

4. ඉහත (03) යටතේ සඳහන් කර ඇති සහන ඉල්ලුම් කිරීම සඳහා අභියාචක විසින් ඉදිරිපත් කරනු ලබන හේතු/කරුණු

4.1 ..................................................................................................................................................................

4.2 ..................................................................................................................................................................

4.3 ..................................................................................................................................................................

4.4 ..................................................................................................................................................................

4.5 ඉහත සඳහන් කරන ලද හේතු/කරුණු සනාථ කිරීම සඳහා අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (1) ...................................................................................................................................................

ඇමුණුම (2) ...................................................................................................................................................

ඇමුණුම (3) ...................................................................................................................................................

5. අභියාචකගේ ප්‍රකාශය

ඉහත දක්වා ඇති සියලු තොරතුරු මාගේ දැනුමට අනුව සත්‍ය හා නිවැරදි තොරතුරු බවද, චේතනාන්විතවම අසත්‍ය හා වැරදි තොරතුරු සැපයීම, එනයින්ම අභියාචනය ප්‍රතික්ෂේප වීමට ද, විනය ක්‍රියාමාර්ගවලට යටත් වීමට ද හේතු වන බව මම හොඳාකාරවම දන්නා බව ද ප්‍රකාශ කර සිටිමි.

අත්සන : ..........................................................

නම : ..........................................................

තනතුර : ..........................................................

6. ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ/නිර්දේශ

..........................................................................................................................................................................

ඉහත අභියාචනය පිළිබඳ මාගේ නිරීක්ෂණ පහත පරිදි වේ.

1. ..................................................................................................................................................................

2. ..................................................................................................................................................................

3. ..................................................................................................................................................................

4. ..................................................................................................................................................................

ඒ අනුව අභියාචක විසින් ඉල්ලා සිටිනු ලබන සහන ලබාදීම සුදුසු/නුසුදුසු බව නිර්දේශ කරමි.

අත්සන : ..........................................................

නම : ..........................................................

තනතුර : ..........................................................

7. පොලිස්පතිගේ නිරීක්ෂණ/නිර්දේශ

.....................................................................................................................................................

ඉහත කරුණු පිළිබඳ මාගේ නිරීක්ෂණ පහත පරිදි වේ.

1. .....................................................................................................................................................
2. .....................................................................................................................................................
3. .....................................................................................................................................................
4. .....................................................................................................................................................

ඒ අනුව අභියාචක විසින් ඉල්ලා සිටිනු ලබන සහන ලබාදීම සුදුසු/නුසුදුසු බව නිර්දේශ කරමි.

අත්සන : .............................................................
නම : .............................................................
තනතුර : .............................................................

පිටපත

01. ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව - (අවශ්‍ය කටයුතු සඳහා මෙම ප්‍රගමන පිටපත ඔබ වෙත කාරුණිකව යොමු කරමි).

EOG 05 - 0140

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.